වාර්ෂික වාර්තාව
2022



වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දැක්ම

ශ්‍රී ලංකාවේ, ආසියාවේ සහ සමස්ත ලෝකයේම පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් සහ ප්‍රතීතනය ලත් විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පත් වීම.

මෙහෙවර

තිරසර අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් සැපයීම පිණිස වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පිරිනැමීම, අධීක්ෂණය සහ ඇගයීම.

හර වටිනාකම්

- **සම අවස්ථා**
- **ශාස්ත්‍රීය සමෝධානය සහ වෘත්තීයභාවය**
- **දැනුම සොයායාම පිළිබඳ දැඩි කැපවීම**
- **සමාජ සංවේදීතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය**
- **විවිධත්වය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස**
- **ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ කළමනාකරණය**
- **මෙහෙයුම් සම්බන්ධයෙන් වගවීම සහ විනිවිදභාවය**


ඉලක්ක

- පහසුකම් සංවර්ධනය කිරීම
- කාර්යක්ෂම පරිපාලන හා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- අධ්‍යයන වැඩසටහන් ස්ථාපිත කිරීම
- අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ සංවේදීතාව සහ වෘත්තීයභාවය මත පදනම් වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
- ක්‍රියාශීලී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ඇති කිරීම
- විනිවිදභාවය සහ යහපාලනය පවත්වාගෙන යාම

අන්තර්ගතය පිටු අංකය

සංවිධානාත්මක ව්‍යුහය 2
කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය 3
1 වන කොටස 2022 වර්ෂය සම්බන්ධයෙන් ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය/සමාලෝචනය 5
2 වන කොටස ආයතනයේ පසුබිම 6
3 වන කොටස අනුබද්ධ අධ්‍යයන මණ්ඩලය 9
(2022 නොවැම්බර් 30 දිනට) 9
3.1 සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 9
3.2 ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 10
3.3 මූලික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 11
3.4 සායනික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 12
4 වන කොටස පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 13
5 වන කොටස අධ්‍යයන වැඩසටහන් සංවර්ධනය 14
6 වන කොටස ධාරිතාව සංවර්ධනය 15
7 වන කොටස සාමාන්‍ය පරිපාලනය 16
8 වන කොටස මූල්‍ය කාර්ය සාධනය 17
8.1 මූල්‍ය සුවිශේෂිතා 17
8.2 ව්‍යවස්ථාපිත වාර්තාව 18
8.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 19
8.4 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය 20
8.5 හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 21
8.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 22
8.7 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් 23
9 වන කොටස විභවතා සහ අපේක්ෂාවන් 26
10 වන කොටස තිරසරභාවය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව 27
11 වන කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව 28
විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු 34

සංවිධානාත්මක ව්‍යුහය



කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

(2022 නොවැම්බර් 30 වන විට)

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1.	මහාචාර්ය සමත් ඩී ධර්මරත්න	අධ්‍යක්ෂ,වෛ.වි.ප.උ.ආ., පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2.	ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක	පීඨාධිපති, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
3.	මහාචාර්ය එම්.ඩී.එම්.අයි.ඩී.කේ. යටවර	පීඨාධිපති, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4.	මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු	පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
5.	ආචාර්ය යූ.අයි. දිසානායක	පීඨාධිපති, ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
6.	මහාචාර්ය එම්.වී.ජී. පින්ටෝ	පීඨාධිපති, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
7.	මහාචාර්ය ඊ.එම්.ඒ.එස්.බී. ඒකනායක	පීඨාධිපති, කළමනාකරණ පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
8.	මහාචාර්ය ආර් ජී.එස්.සී. රාජපක්ෂ	පීඨාධිපති, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
9.	මහාචාර්ය පී.ජී. අනිල් පුෂ්පකුමාර	පීඨාධිපති, පශු වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
10.	මහාචාර්ය මංජුල ආටිගල	පීඨාධිපති, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
11.	ඩබ්ලිව්.කේ.එල්.ඊ. වලල්ලාවිට	අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය නරමින් (ප්‍රධාන මූල්‍ය නිලධාරි, අධ්‍යාපන අමාත්‍යාංශය)
12.	ආචාර්ය ඩී.ජී.ජී.එස් දයානාත්	මුදල් අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය නරමින් (අධ්‍යක්ෂ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය)
13.	ආචාර්ය සුනිල් ද අල්විස්	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය නරමින් (අතිරේක ලේකම්, වෛද්‍ය සේවා, සෞඛ්‍ය අමාත්‍යාංශය)
14.	ආචාර්ය අසේල ගුණවර්ධන	සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය
15.	ආචාර්ය පණ්ඩුල සිරිබද්දන	කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ නියෝජනය නරමින්, (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය)
16.	මහාචාර්ය ඉෂාන් ද සොයිසා	වි.වි.ප්‍ර.කොා.ස. විසින් නම්කරන ලද (කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයේ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය)
17.	මහාචාර්ය ටී කුමානන්	වි.වි.ප්‍ර.කොා.ස. විසින් නම්කරන ලද (යාපනය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය)
18.	කමල් පද්මසිරි මහතා	වි.වි.ප්‍ර.කොා.ස. විසින් නම්කරන ලද (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ හිටපු ලේකම්)
19.	ආචාර්ය සුරන්ත පෙරේරා	වි.වි.ප්‍ර.කොා.ස. විසින් නම්කරන ලද (කොළඹ කාසල් වීදිය කාන්තා රෝහලේ ළමා රෝග විශේෂඥ සහ නවජ රෝග විශේෂඥ)
20.	මහාචාර්ය දේවක කේ වීරකෝන්	වි.වි.ප්‍ර.කොා.ස. විසින් නම්කරන ලද (කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ සත්ත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය)
21.	මහාචාර්ය ඩී.එම්. දිසානායක	වෛද්‍ය පීඨය විසින් නම්කරන ලද (පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ, ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය)
22.	මහාචාර්ය අරින්ද ධර්මපාල	වෛද්‍ය පීඨය විසින් නම්කරන ලද (පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ, ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයේ ශල්‍ය වෛද්‍ය මහාචාර්ය)

	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
23.	මහාචාර්ය පී.එස්.කේ. නානායක්කාර	වෛද්‍ය පීඨය විසින් නම්කරන ලද (පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ, නිර්වින්දන හා දැඩි සත්කාර අධ්‍යයන අංශයේ නිර්වින්දන විද්‍යාව පිළිබඳ මහාචාර්ය)
24.	ආචාර්ය සර්ධා හේමප්‍රිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරන ලද (මහනුවර ජාතික රෝහලේ ප්‍රසව හා නාරීවේද විශේෂඥ)
25.	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විද්‍යා ජ්‍යෝති වජිර එච්.ඩබ්ලිව් දිසානායක	පාලක සභාව විසින් නම් කරන ලද (පීඨාධිපති, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
26.	සමන්ත රත්වත්තේ මහතා	පාලක සභාව විසින් නම් කරන ලද (ජනාධිපති නීතීඥ)
27.	මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව	සම සාමාජික (අධ්‍යක්ෂක, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
28.	මහාචාර්ය ටෙරන්ස් මධුජිත්	සම සාමාජික (නියෝජ්‍ය උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
29.	එච්.එම්.ඩී.වයි මහත්මිය. හේරත්	වැඩබලන ලේඛකාධිකාරී, වෛ.වි.ප.උ.ආ.
30.	ඩබ්ලිව්.එච්.ඒ.ඩී. දිල්රුක්ෂි	වැඩ බලන නියෝජ්‍ය මූල්‍යාධිකාරී, වෛ.වි.ප.උ.ආ.

1 වන කොටස 2022 වර්ෂය සම්බන්ධයෙන් ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය/සමාලෝචනය



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (වෛ.වි.ප.උ.ආ.) ප්‍රථම අධ්‍යක්ෂවරයා ලෙස පත්ව 2021 සැප්තැම්බර් 02 දින වැඩ භාරගැනීමෙන් අනතුරුව වෛ.වි.ප.උ.ආයතනය දිගු ගමනක් සනිටුහන් කර ඇති අතර මේවන විට එහි ප්‍රථම උපාධි වැඩසටහන් මහජනතාවට පිරිණැමීම සඳහා සියළු කටයුතු සූදානම් කර සිටී.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආරම්භය 2021 සැප්තැම්බර් මාසයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශයේ මහාචාර්ය සමත් ඩී ධර්මරත්න මහතාගේ (පළමු අධ්‍යක්ෂ) කාමරයෙන් සිදුවිය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.ඩී.ළමවංශ, වෛද්‍ය පීඨයේ පීඨාධිපති මහාචාර්ය වසන්ති පින්ටෝ යන මහත්ම මහත්මීන්ගේ අගනා ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන්, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පළමුව වෛද්‍ය පීඨයේත් පසුව එය වර්තමානයේ පිහිටා ඇති පේරාදෙණිය ගැටඹේ පැරණි පොලිස් ස්ථාන ගොඩනැගිල්ලෙහිත් පවත්වාගෙන යාමට අවකාශ සැලසුනි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා වැඩබලන ලේඛකාධිකාරීවරයෙකු, වැඩබලන මූල්‍යාධිකාරීවරයෙකු, කළමනාකරණ සහකාරවරයෙකු සහ පර්යේෂණ සහකාරවරයෙකු වෛද්‍ය පීඨයෙන් ලබාදෙන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මෙම කටයුතු සඳහා සහාය ලබා දෙන ලදී.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, එහි සභාපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග සහ ගණකාධිකාරී එස්. රණවීර යන මහත්වරුන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීම සඳහා සහය වූ අතර එහිදී අවශ්‍ය සහයෝගය මෙන්ම මුදල් ප්‍රතිපාදන ලබා දීමට ඔවුහු කටයුතු කළහ. වෛද්‍ය පීඨයේ පාඨමාලා දෙකක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කිරීම අනුමත කරමින් උපාධි පාඨමාලා ස්ථාපිත කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ද සහාය විය.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පළමු අධ්‍යක්ෂවරයා වශයෙන් මෙම වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා ඉතා සතුටට හා ආඩම්බරයට පත්වන අතර 2022 වසරේ ඇති වූ සමාජ, මූල්‍ය සහ ආයතනික අර්බුද මධ්‍යයේ වුවද, මට සහ මගේ කාර්ය මණ්ඩලයට සුවිශේෂී ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වූ බව සිතමි.

ශ්‍රී ලංකාවේ දෙවන වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය මෙවන් ප්‍රගතියක් කරා රැගෙන යාමට මට උපකාර කළ, මට සහාය දුන් සහ දිරිදුන් සැමට ස්තූතිය පලකිරීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මහාචාර්ය (වෛද්‍ය) සමත් ඩී ධර්මරත්න
අධ්‍යක්ෂක

2 වන කොටස ආයතනයේ පසුබිම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A (1) වගන්තිය යටතේ 2019 සැප්තැම්බර් 9 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2019 අංක 2141/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. මෙය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

ආයතනයේ බලධාරීන් වන්නේ: -

(අ) කළමනාකරණ මණ්ඩලය

(ආ) අධ්‍යයන මණ්ඩල සහ

(ඇ) එවැනි අධිකාරීන් බවට ආඥාපනත මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් ආයතන.

ආයතනය විසින් පහත සඳහන් එක් එක් වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍ර සඳහා අධ්‍යයන මණ්ඩල පිහිටුවා ඇති අතර, කළමනාකරණ මණ්ඩලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු ඉගැන්වීම් සහ පුහුණුව ලබාදීමට අපේක්ෂා කරන වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍ර සඳහා වෙනත් මණ්ඩල ස්ථාපිත කරනු ලැබිය හැක.

- (අ) සායනික විද්‍යා;
- (ආ) මූලික වෛද්‍ය විද්‍යාව;
- (ඇ) ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව; සහ
- (ඈ) සෞඛ්‍ය විද්‍යාව
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රධාන මහාචාර්ය සමත් ඩී ධර්මරත්න මහතා 2021 සැප්තැම්බර් 01 වැනි දින වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පළමු අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද අතර ඔහු විසින් 2021 සැප්තැම්බර් 02 දින එම ධුරයේ වැඩ භාර ගන්නා ලදී.
- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2022 මාර්තු මාසයේදී එහි වර්තමාන වාසස්ථානය වන ගැටඹේ පේරාදෙණිය පිහිටි පරිශ්‍රය වෙත ගෙන ගිය අතර, 2022 ජනවාරි මාසයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සෙනට් ශාලාවේදී එහි පළමු කළමනාකරණ මණ්ඩලය රැස්වීම පැවැත්වීය. 2022 දී ආයතනයේ අධ්‍යයන මණ්ඩලය පිහිටුවීමට ද එය සමත් වූ අතර එහි පළමු වැඩසටහන් 2023 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
- පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම (2022-2026) කෙටුම්පත් කර එය කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කරන ලදී. මෙම කටයුත්ත 2023 දී අවසන් වනු ඇත.
- උපායමාර්ගික සැලැස්ම මඟින් ඉගැන්වීමේ හා පර්යේෂණවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම; පරිපාලන හා මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම; සහ යහපාලනය සහ සදාචාරාත්මක පැවැත්ම ශක්තිමත් කිරීම යන ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර තුනක් යටතේ ඉලක්ක 6ක් ඉදිරිපත් කර ඇත. උපාය මාර්ගික සැලැස්ම 2022-2026 පහත සඳහන් ඉලක්ක හයක් යටතේ උපාය මාර්ග තිස් එකක් සහ අරමුණු දහතුනක් යටතේ ක්‍රියාකාරකම් හතළිස් අටක් ක්‍රියාත්මක කරනු ඇත.

- පහසුකම් වැඩිදියුණු කිරීම
- කාර්යක්ෂම පරිපාලන හා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම

- අධ්‍යයන වැඩසටහන් සකස් කිරීම
- අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ සංවේදීතාව සහ වෘත්තීයභාවය මත පදනම් වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
- ක්‍රියාශීලී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම
- විනිවිදභාවය සහ යහපාලනය පවත්වාගෙන යාම

උපායමාර්ගික සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම් ධනාත්මක අයුරින් ක්‍රියාත්මක කිරීම මඟින් මෙම ආයතනය ශ්‍රී ලංකාවේ, ආසියාවේ සහ ලෝකයේ පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් සහ ප්‍රතිතනය ලත් විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පත්වීමට පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආයතනය පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර අනුව උපාධි වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරයි.

කෙටි පාඨමාලා

ශාස්ත්‍රපති

දර්ශනපති සහ

දර්ශන ශූරී පඨමාලා

පහත සඳහන් උපාධි වැඩසටහන් ප්‍රචාරණය කිරීමට පෙර ඒ සඳහා ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

• ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc ESS) වැඩසටහන

• මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) වැඩසටහන

මෙම වැඩසටහන් 2023 දී ආරම්භ කිරීම ආයතනය අරමුණු කරයි.

ආයතනය සිය පශ්චාත් උපාධි පිරිනැමීමේ කර්තව්‍යය වඩා පුළුල් කිරීම සහ විවිධාංගීකරණය ඇතිකිරීම අරමුණුකොට ඉහත අපේක්ෂිත වැඩසටහන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීමට සහ අන්තර්විෂයීක සහ බහුවිෂයීක වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කරමින් නව පාඨමාලා හඳුන්වා දීමට එහි සැලසුම් පවත්වා ගෙන යනු ලැබේ. ආයතනය විසින් උපායමාර්ගික සැලැස්මට අනුකූලව අවශ්‍ය පරිදි නව උපාධි වැඩසටහන් සකස් කරනු ලබයි. ආයතනය ශ්‍රම බලකාය සඳහා නවමු කෙටිකාලීන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධවී කටයුතු කරනු ඇත.

පසුබෑම් සහ ඒ සඳහා තුඩුදුන් හේතු

ආයතන ස්ථාපිත කිරීමේ අවස්ථාවේ සිට එහි ආයතනයේ ක්‍රියාකාරිත්වයට අනේකවිධ බාධා එල්ල විය. රට වසාදැමීම වැනි අගුලු දැමීම වැනි කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා ගනුලැබූ පියවරයන් සමඟ ආයතනයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට බාධා ඇති විය.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත මූල්‍ය ප්‍රතිපාදන ලැබීම 2022 පෙබරවාරි මාසයේදී සිදුවිය. අවශ්‍ය අරමුදල් නොමැතිවීම හේතුවෙන් ආයතනයට විවිධ මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවිය. ඒ සියලු දුෂ්කරතා මධ්‍යයේ වුවද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගියේය.

මතු දැක්වූ හේතු නිසා අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීම ප්‍රමාද විය. ඉහත සඳහන් කළ තත්ත්වයන් සමනය වීමත් සමඟ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය අධ්‍යයන වැඩසටහන් සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ කළේය.

3 වන කොටස අනුබද්ධ අධ්‍යයන මණ්ඩලය

(2022 නොවැම්බර් 30 වන විට)

3.1 සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සමාරම්භක රැස්වීම 2022 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී. මහාචාර්ය එච්.එම්.ටී.යූ. හේරත් සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ලෙසත් මහාචාර්ය බී.ඊ.පී. මෙන්ඩිස් එහි ලේකම්වරයා ලෙස පත් කරන ලදී.

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය ඩී.ආර්.ඒ. දිසානායක	පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2	ආචාර්ය ආර්.එම්.ආර්.ඩී.බී. රණවීර	ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3	ආචාර්ය ඩබ්ලිව්.ආර්.පී. විජේසිංහ	විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4	මහාචාර්ය ආර්.එච්.කුරුප්පුගේ	කළමනාකරණ පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
5	මහාචාර්ය සී.එම්. වික්‍රමතිලක	වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
6	මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
7	ශෂී අලහකෝන් මහත්මිය	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
8	මහාචාර්ය එච්.එම්.ටී.යූ. හේරත්	සම සෞඛ්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
9	මහාචාර්ය බී.ඊ.පී. මෙන්ඩිස්	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
10	ආචාර්ය ජී දිසානායක මහත්මිය	ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
11	මහාචාර්ය එල්.පී.එම්.එම්.කේ. පතිරගේ	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

3.2 ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

ව්‍යවහාරික වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සමාරම්භක රැස්වීම 2022 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී. ආචාර්ය රලින්ද පල්ලාවල මහතා ව්‍යවහාරික වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.එන්.කේ. නවරත්න එහි ලේකම්වරයා ලෙස පත් කරන ලදී.

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය දිලීප් ද සිල්වා	දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2	මහාචාර්ය ජනනී කොට්ටහච්චි	වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3	මහාචාර්ය ආර්.එච්.ඒ.අයි. රත්නවීර	වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
4	ආචාර්ය රලින්ද පල්ලාවල	ශික්ෂණ රෝහල, පේරාදෙණිය
5	මහාචාර්ය ඩිලානි ලොකුහෙට්ටි	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
6	ආචාර්ය සුමෙත් පෙරේරා	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
7	මහාචාර්ය ටී.සී. අගම්පොඩි	වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
8	ජේ. අරුල්නන්දන් මහත්මිය	වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
9	ආචාර්ය අයි.ඊ. වීරසිංහ	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
10	මහාචාර්ය එස්.කුමාරන්	ජාතික රෝහල, මහනුවර
11	ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.එන්.කේ. නවරත්න	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

3.3 මූලික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

මූලික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සමාරම්භක රැස්වීම 2022 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී. මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක මූලික වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර ආචාර්ය ජේ මහින්දන් එහි ලේකම්වරයා ලෙසත් පත් කරන ලදී.

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක	දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2	ආචාර්ය වරුණි තෙන්නකෝන්	වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3	මහාචාර්ය එල්.ඩබ්ලිව්.ජී.ආර්. අල්විස්	වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
4	ආචාර්ය කුමුදු බණ්ඩාර	ශික්ෂණ රෝහල, පේරාදෙණිය
5	මහාචාර්ය ඩී.ජේ. ඇන්තනි	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
6	ආචාර්ය එච්.ටී.ඩබ්ලිව්. වීරකෝන්	වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
7	ආචාර්ය එන්.ඩී.ඒ. වාගීෂා	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
8	ආචාර්ය ජේ මහින්දන්	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
9	ආචාර්ය සී.ටී. කැප්පෙටියාගම	ජාතික රෝහල, මහනුවර
10	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වී. අරසරත්නම් මිය	වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලයේ
11	ආචාර්ය ටී.ඩී.පී. නන්දදේව	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

3.4 සායනික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

සායනික විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සමාරම්භක රැස්වීම 2022 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී. මහාචාර්ය ඩී.ඒ.සී.එල්. දළුගම මහතා සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ද මහාචාර්ය ආර්.ඩී.ජයසංහ සහි ලේකම්වරයා ලෙස ද පත්කරන ලදී.

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය ආර්.ඩී. ජයසිංහ	දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2	මහාචාර්ය ටී.පී. වීරරත්න	වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
3	ආචාර්ය එම්.එස්. සන්ධ්‍යා බණ්ඩාර	ශික්ෂණ රෝහල, පේරාදෙණිය
4	මහාචාර්ය පූජිත වික්‍රමසිංහ	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
5	මහාචාර්ය චමිල් මාරසිංහ	වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
6	ආචාර්ය වී.අයි. ධර්මවර්ධන	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
7	ආචාර්ය ඒ.එම්.ඒ.එච්.එම්.එස්. සේනානායක	වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
8	මහාචාර්ය එම්. උමාකාන්ත්	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
9	ආචාර්ය කේ.එච්. එදිරිසිංහ	ජාතික රෝහල, මහනුවර
10	මහාචාර්ය කේ. මුහුන්තන්	වෛද්‍ය පීඨය යාපනය විශ්වවිද්‍යාලය
11	මහාචාර්ය ඩී.ඒ.සී.එල්. දළුගම	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

4 වන කොටස පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අධ්‍යක්ෂවරයෙකු, සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු, සහකාර මූල්‍යාධිකාරීවරයෙකු, තාවකාලික පර්යේෂණ සහකාරවරයෙකු, කළමනාකරණ සහකාරවරයෙකු සහ තාක්ෂණික නිලධාරියෙකු ඇතුළුව අනුමත සේවක තනතුරු 6කින් සමන්විත වේ. අධ්‍යක්ෂ, තාවකාලික පර්යේෂණ සහකාර සහ කළමනාකරණ සහකාර යන තනතුරු 2022 දෙසැම්බර් වන විට පුරවා ඇත.

කාර්යමණ්ඩල වර්ගීකරණය	වැටුප් පරිමාව	අනුමත කාර්ය මණ්ඩලය	පවත්නා කාර්යමණ්ඩලය								
			ස්ථිර			වැඩබලන			කොන්ත්‍රත්		
			ස්ත්‍රී	පුරුෂ	එකතුව	ස්ත්‍රී	පුරුෂ	එකතුව	ස්ත්‍රී	පුරුෂ	එකතුව
		(1)			(2)			(3)			(4)
අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 3 to U-AC 5	1	1	-	1	-	-	-	-	-	-
පරිපාලන කාර්ය මණ්ඩලය සහ මූල්‍ය කාර්ය මණ්ඩලය	U-EX 1	2	-	-	-	0	2	2	-	-	-
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	Fixed	1	-	-	-	-	-	-	0	1	1
තාක්ෂණික කාර්ය මණ්ඩලය	U-MT 1	1	0	0	0	0	0	0	0	0	0
ලිපිකරු සහ සම ශ්‍රේණි කාර්ය මණ්ඩලය	U-MN 1	1	0	1	1	-	-	-	-	-	-
එකතුව		6	1	1	2	0	2	2	0	1	1

බඳවා ගැනීම් සම්බන්ධයෙන් රට තුළ පවතින දුෂ්කර වාතාවරණය හේතුවෙන්, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වැඩ බලන සහකාර ලේඛකාධිකාරීවරයෙකු සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ බලන නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයෙකුගෙන් යුක්තව පවත්වාගෙන යනු ලැබේ.

5 වන කොටස අධ්‍යයන වැඩසටහන් සංවර්ධනය

තිරසර අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් සැපයීම පිණිස වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පිරිනැමීම, අධීක්ෂණය සහ ඇගයීම යනුවෙන් දැක්වෙන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙවරට අනුව එය නව වෙළෙඳපොළ අරමුණුකොටගත් තේමාත්මක උපාධි වැඩසටහන් හඳුන්වාදීමේ ක්‍රියාවලිය ආරම්භ කළේය. 2023 වර්ෂයේදී, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය පහත දැක්වෙන නව උපාධි වැඩසටහන් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.

• ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc ESS) පාඨමාලාව

• මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) පාඨමාලාව

මෙම වැඩසටහන් දෙක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පැවති පාඨමාලා වන අතර, එය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ තවත් වැඩසටහනක් ද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කිරීම සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලියක පවතී.

තවත් වැඩසටහන් තුනක් විෂයමාලා සංවර්ධන අදියරේ පවතින අතර ඒවා 2023 දී පිරිනමනු ඇත. ඉදිරි වසර තුළ වැඩමුළු කිහිපයක් පැවැත්වීමට ද සැලසුම් කර ඇත.

දර්ශණශූරී සහ දර්ශණපති උපාධි වැඩසටහන් ද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙතින් පිරිනැමීමට අපේක්ෂාකරන අනෙකුත් ආකර්ශනීය පාඨමාලාවේ.

කෙසේවුවද, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට 2023 වර්ෂයේ දී සිය අනුමත සේවක සංඛ්‍යාව පිරවිය හැකි අතර, මෙහි කාර්ය මණ්ඩලයට අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීමට සහ පශ්චාත් උපාධි වෛද්‍ය සහ සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙම නව ආයතනය ස්ථාවර පවත්වාගෙන යාමට හැකි වනු ඇත.

6 වන කොටස ධාරිතා සංවර්ධනය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ගෘහ භාණ්ඩ සහ ඩෙස්ක්ටොප් පරිගණක, ඡායා පිටපත් යන්ත්‍රයක් සහ කාර්යාල අල්මාරි වැනි උපකරණ මිලදී ගන්නා ලදී. ප්‍රමාණවත් කාර්යාලීය ගෘහභාණ්ඩ නොමැතිවීම හේතුවෙන් ආයතනයට දිගින් දිගටම ගැටලු මතු විය. රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ප්‍රමාණවත් පරිදි ගෘහ භාණ්ඩ මිලදී ගැනීම දුෂ්කර කටයුත්තක් විය. විශ්වවිද්‍යාලය තුළ ඇති අනෙකුත් පීඨවලින් සහ පශ්චාත් උපාධි ආයතනවලින් අමතර ගෘහ භාණ්ඩ ලබා ලැනීම මගින් එම අවශ්‍යතාවය සපුරාලීමට ආයතනය කටයුතු කරයි.

ආයතනයේ මේවන විට පවතින දේශන ශාලා, මණ්ඩල කාමරයක් ආදිය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම සහ පරිපාලන ක්‍රියා පටිපාටි ඉඩකඩ නොමැති වීමද තවත් විශාල ගැටලුවකි.

7 වන කොටස සාමාන්‍ය පරිපාලනය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පවතින පරිපාලනමය සහ ක්‍රියාකාරී අභියෝග සැලකිල්ලට ගනිමින්, සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ආයතනය විසින් වැඩසටහන් සකස් කරන ලදී. ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් දෙකක් 2022 දෙසැම්බර් මාසයේදී පැවැත්විණි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් කමිටුවේ උපදෙස් අනුව එහි ක්‍රියාකාරිත්වය සහ පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා තවදුරටත් වෙනස්කම් සිදු කිරීමට පටන් ගත්තේය. ආයතනය විසින් එහි උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් නවයක් අඛණ්ඩව පවත්වන බද අතර ඔවුන්ගේ උපදෙස් හා අනුමැතිය අනුව අවශ්‍ය තීරණ ගෙන ඇත. තවද, ආයතනයේ මූල්‍ය කමිටුවේ සමාරම්භක රැස්වීම 2022 දෙසැම්බර් මාසයේදී පවත්වන ලදී.

8 වන කොටස මූල්‍ය කාර්යසාධනය

8.1 මූල්‍ය සුවිශේෂිතා

රජයේ ප්‍රදාන (ශ්‍රී.ලං.ගි.ප්‍ර.20)

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි විධිවිධානවලට අනුකූලව, පුනරාවර්තන වියදම් සඳහාවන රජයේ ප්‍රදාන ආයතනයට ලැබුණු විට පමණක් හඳුනාගනු ලැබේ. වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදානය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනාගෙන ඇත.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන රජයේ ප්‍රදාන ලෙස හඳුනාගැනේ. ආදායම් ක්‍රමයට අදාළ ප්‍රදාන ඉදිරිපත් කිරීම ආයතනය තුළ රජයේ ප්‍රදානය යටතේ පවත්වාගෙන යනු ලැබේ. 2022 වසරේදී ලද රජයේ ප්‍රදාන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

මුළු පුනරාවර්තන ප්‍රදාන: රු. 8,980,000.00

මුළු ප්‍රාග්ධන ප්‍රධාන : රු. 0.00

විස්තරය	ප්‍රතිපාධිත මුදල රු.	නිදහස් කරන ලද ප්‍රමාණය රු.	නිදහස් නොකරන ලද ප්‍රමාණය රු.
පුණරාවර්තන ප්‍රදාන (පුද්ගල පඩිනඩි සහ වෙනත් පුණරාවර්තන)	9,000,000.00	8,980,000.00	20,000.00
ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම් අත්පත්කරගැනීම)	5,000,000.00	-	5,000,000.00

මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)

2022 වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 522,363.42ක් වන අතර මූල්‍ය නොවන ගනුදෙනු ගැලපීමෙන් පසු ආයතනයේ ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ.

විස්තරය	2022 (රු.)
ශුද්ධ හිඟය/අතිරික්තය	522,363.42
එකතුකළා: මූල්‍ය නොවන ගණුදෙනු	75,541.30
මූල්‍ය නොවන ගණුදෙනු ගැළපීමෙන් පසු ශුද්ධ අතිරික්තය/ හිඟය)	**597,904.72**

අධ්‍යාපන සේවාව පවත්වාගෙන යාමට සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්තය ලැබීමේදී ආදායමට ගණනය කර ඇත.

8.2 ව්‍යවස්ථාපිත වාර්තාව

ව්‍යවස්ථාපිත වාර්තාව සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අනුගමනය කරන ලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ හෙළිදරව් කිරීම.

ආයතනික මූල්‍ය තොරතුරු

1.1 ආයතනික තොරතුරු

1.1.1 වාර්තාකරණ අස්ථීත්වය

ශ්‍රී ලංකාවේ, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගැටඹේ, පේරාදෙණියේ පිහිටි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, 2019 සැප්තැම්බර් 9 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය සමඟ කියවියයුතු 18 වැනි වගන්තිය යටතේ සාදන ලද ආඥාපනතකට අනුව පිහිටුවන ලද පූර්ණ වශයෙන් රජයට අයත් උසස් අධ්‍යාපන ආයතනයකි. මෙම ආඥාපනත 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයත ආඥාපනත ලෙස හඳුන්වනු ලැබේ. මෙම ආයතනයේ මූල්‍ය මෙහෙයුම් 2022 පෙබරවාරි මස ආරම්භ විය.

1.1.2 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2022 ජනවාරි 13 වැනි දින පැවති එහි පළමු රැස්වීමේදී විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දෙන ලදී.

1.1.3 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා වේ.

1.1.4 මූල්‍ය ප්‍රකාශන

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය හා සත්‍ය මුදල සංසන්දනය කිරීම සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් ඇතුළත් වේ.

8.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පෙරාදෙණිය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	2022 රු.	රු.
වත්කම්			
වත්මන් වත්කම්			
මුදල් සහ මුදල් සමාන	01	1,888,707.48	
නොපියවූ අත්තිකාරම්		42,000.00	
			1,930,707.48
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	02	1,412,136.70	
			1,412,136.70
මුළු වත්කම්			**3,342,844.18**
වගකීම්			
ජංගම වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන		140,665.62	
ගෙවිය යුතු විගණන ගාස්තු		100,000.00	
ගෙවිය යුතු මුදල්	03	2,343,828.00	
අත්තිකාරම් වියදම්	04	235,987.14	
මුළු වගකීම්			**2,820,480.76**
			2,820,480.76
මුළු ශුද්ධ වත්කම්			**522,363.42**
ශුද්ධ වත්කම් / හිමිකම්			
වසර තුළ අතිරික්තය		522,363.42	522,363.42
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්			**522,363.42**

මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතා සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බව මම මෙයින් සහතික කරමි.

නියෝජ්‍ය මූල්‍යාධිකාරී

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරනු ලැබේ. කළමනාකරණ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ/ ගිණුම් නිලධාරි

මහාචාර්ය ඒ.එම්. ආටිගල	මහාචාර්ය වසන්ති පින්ටෝ
කළමනාකරණමණ්ඩල සාමාජික	කළමනාකරණමණ්ඩල සාමාජික

8.4 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

මූල්ය කාර්ය සාධන ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පෙරාදෙණිය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**සටහන**	**2022** **රු.**
මෙහෙයුම් ආදායම		
පුනරාවර්තන ප්‍රදාන		8,980,000.00
		8,980,000.00
මෙහෙයුම් වියදම්		
පුද්ගල පඩිනඩි	05	7,657,922.50
ගමන් වියදම්	06	312.00
සැපයුම් සහ පාරිභෝජ්‍ය	07	88,382.69
කොන්ත්රාත් සේවා	08	110,509.09
ක්ෂය	09	75,541.30
වෙනත් පුනරාවර්තන වියදම්	10	524,969.00
මුළු මෙහෙයුම් වියදම්		**8,457,636.58**
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය	11	**522,363.42**

8.5 හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පෙරාදෙණිය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

සටහන 11

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**ප්‍රාග්ධන අරමුදල්**	**සමුච්චිත අරමුදල**	**හිමිකම්වල අනෙකුත් සංරචක**	**එකතුව රු.**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය (වාර්තා කරනලද)				
අධි/ඌණ ප්‍රතිපාදන	-	-	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	-	-
ශුද්ධ අරමුදල් සංචලනය	-		-	-
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය).	-	-	522,363.42	522,363.42
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	522,363.42	522,363.42

8.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පෙරාදෙණිය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2022** **රු,**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය	
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/ (හිඟය)	522,363.42
මූල්‍ය නොවන සංචලන	**522,363.42**
ක්ෂය වැඩි වීම	75,541.30
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වැඩි වීම	140,665.62
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වැඩි වීම	100,000.00
කාරක ප්‍රාග්ධනය වැඩිවීම/අඩුවීම	**316,206.92**
ගෙවිය යුතු මුදල් වැඩිවීම	2,344,028.00
උපචිත වියදම්/ප්‍රතිපාදන වැඩිවීම	235,787.14
ණය සහ අත්තිකාරම් වැඩි වීම	(42,000.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,537,815.14**
ආයෝජන කටයුතු වලින් ජනිත මුදල් ප්‍රවාහය	
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(1,487,678.00)
ආයෝජන කටයුතුවලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,487,678.00)**
මූල්‍ය කටයුතුවලින් ජනිත මුදල් ප්‍රවාහය	-
මූල්‍ය කටයුතුවලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	-
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**1,888,707.48**
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	-
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**1,888,707.48**

8.7 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා		2022
		රු.
01. මුදල් සහ මුදල් සමාන දෑ		
අංක 057-1-001-2-0046313 දරන මහජන බැංකු ගිණුම් අංකය		1,041,307.48
අංක 0088478535 දරන ලංකා බැංකු ගිණුම් අංකය		847,400.00
	එකතුව	**1,888,707.48**

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා	2022	2022	2022	2022	2022
	රු.	රු.	රු.	රු.	රු.

02.දේපළ, පිරියත සහ උපකරණ

	ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	කාර්යාලීය උපකරණ	රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ	එකතුව
පිරිවැය				
2022 ජනවාරි 01 දිනට	-	-	-	-
අඩුකළා/එකතුකළා - එකතුකිරීම්	-	1,487,678.00	-	1,487,678.00
බැහැරකිරීම්/මාරුකිරීම්	-	-	-	-
2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය	-	1,487,678.00	-	1,487,678.00
අඩුකළා- බැහැරකිරීම්				
2022 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය	-		-	
බැහැරකිරීම්/මාරුකිරීම්	-		-	
ආදායම් සහ වියදම් ගිණුමට බැරකළා	-	(75,541.30)	-	(75,541.30)
2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය		(75,541.30)	-	(75,541.30)
2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**-**	**1,412,136.70**	-	**1,412,136.70**

03. ගෙවියයුතු		රු.
පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවියයුතු		2,000,000.00
ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම		343,828.00
	එකතුව	2,343,828.00

04. උපචිත වියදම්	
දුරකථන සන්නිවේදන වියදම්	48,969.51
වැටුප් සහ වේතන-2022 දෙසැම්බර්	18,329.84
ජීවන වියදම් දීමනාව	4,277.42
විෂේශ දීමනාව	3,665.97
රු.5000ක මාසික දීමනාව	2,741.94
කළමනාකරණ කමිටු දීමනාව	8,248.43
විෂේශ සේවා සහා සහ කමිටු	144,000.00
වි.අ.අරමුදල 15%	4,628.36
සේ.භා.අ.	925.67
ගෙවියයුතු මුද්දර ගාස්තු	200.00
එකතුව	235,987.14

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා	සටහන	තත්‍ය රු.
05. පුද්ගල පඩිනඩි		
වැටුප් සහ වේතන		1,811,014.03
වි.අ.අරමුදල 15%		656,347.37
සේ.හා.අ. 3%		131,269.47
අධ්‍යයන දීමනා		2,419,509.19
පර්යේෂණ දීමනා		522,733.47
ජීවන වියදම් දීමනාව		136,877.42
අතිකාල		3,193.50
වැඩබැලීම් සඳහා ගෙවීම්		511,751.25
රු.5000ක මාසික දීමනාව		87,741.94
කළමනාකරණ කමිටු දීමනාව		306,953.27
විෂේශ දීමනාව		3,665.97
ප්‍රවාහන දීමනාව		550,000.00
ඉන්ධන දීමනාව		376,200.00
පාර්තෝෂික දීමනාව		140,665.62
	එකතුව	**7,657,922.50**
06. ගමන් වියදම්		
ගමන් වියදම් (දේශීය)		312.00
	එකතුව	**312.00**
07. සැපයුම්		
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා		56,175.69
වෙනත්		32,207.00
	එකතුව	**88,382.69**
08. ගිවිසුම්ගත සේවා		
ප්‍රවාහන		-
පිරිසිදුකිරීම් සේවා		-
තැපැල් සහ විදුලිසංදේශන		107,879.09
මුද්‍රණ ප්‍රචාරණ		2,630.00
	එකතුව	**110,509.09**
09. ස්ථාවර වත්කම් ක්ෂය කිරීම		
කාර්යාලීය උපකරණ		(75,541.30)
	එකතුව	**(75,541.30)**
10. වෙනත් පුනරාවර්තන වියදම්		
විෂේශ සේවා - සභා සහ කමිටු		409,000.00
විෂේශ සේවා - වෘත්තීය සහ වෙනත් ගාස්තු		100,000.00
සංග්‍රහ වියදම්		7,219.00
බැංකු ගාස්තු		8,750.00
	එකතුව	**524,969.00**

9 වන කොටස විභවතා සහ අපේක්ෂාවන්

පවත්නා වැඩසටහන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම සහ අන්තර්විෂයීක සහ බහුවිෂයීක පාඨමාලා කෙරෙහි අවධානය යොමුකරමින් නව වැඩසටහන් හඳුන්වා දීම හරහා සිය පශ්චාත් උපාධි වැඩසටහන් පුළුල් කිරීමට සහ විවිධාංගීකරණය කිරීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සැලසුම් කර ඇත. උපායමාර්ගික සැලැස්මේ හඳුනාගෙන ඇති පරිදි සහ අවශ්‍යතාවය අනුව නව උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම ආයතනය අඛණ්ඩව සිදු කරනු ඇත. එමගින් සිසුන් සඳහා කෙටි සහතික පාඨමාලා ද පැවැත්වීමට කටයුතු කරනු ඇත.

පර්යේෂණ ප්‍රකාශනය සහ ඉදිරිපත් කිරීම හරහා ඵලදායි සහ උසස් තත්ත්වයේ පර්යේෂණ පැතිකඩක් පවත්වා ගනිමින් සිසුන් විසින් සිදුකරනු ලබන පර්යේෂණ කටයුතු දිරිමත් කිරීමට ඊට සහ සහාය වීමට වැඩි සම්පත් සහ පහසුකම් සැපයීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අදහස් කරයි. 2022-26 උපායමාර්ගික සැලැස්ම සහ ඒ අනුව සැකසූ ක්‍රියාකාරී සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම මගින් මෙම ආයතනය රටේ සහ කලාපයේ ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනයක් ලෙස ඉහළ නැංවීම ආයතනයේ අපේක්ෂාව වේ.

10 වන කොටස තිරසාරභාවය මත පදනම් වන අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වනාහි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A (1) වගන්තිය යටතේ 2019 සැප්තැම්බර් 9 වැනි දින පිහිටුවන ලද වෛද්‍ය විද්‍යාව සඳහා වන නව පශ්චාත් උපාධි ආයතනයක් වන අතර එය අංක 2141/13 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. මෙම ආයතනයේ කටයුතු ක්‍රියාත්මකවීම 2019 වසරේ සහ 2021 දී ප්‍රථම අධ්‍යක්ෂවරයා පත් කිරීමත් සමඟ ආරම්භ විය. වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව ඉහළ නැංවීම මෙන්ම මහනුවර සහ ඒ අවට සහ විශේෂයෙන් කොළඹින් පිටත පදිංචිව සිටින සහ සේවා නියුක්තව සිටින, මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවෙන් පසුවන සිසුන් ආකර්ෂණය කර ගැනීම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වශයෙන් අපගේ බලාපොරොත්තුව සහ අපේක්ෂාව වේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සහ ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන යන උපාධි දෙකක් ආරම්භ කර ඇති අතර ඒවා මේ දක්වා සිසුන් 58 දෙනෙකු විසින් එම පාඨමාලා හදාරනු ලැබේ. මෙම උපාධි වැඩසටහන් දෙක සඳහා බඳවා ගන්නාලද දෙවන ශිෂ්‍ය කණ්ඩාම් සඳහා වන අධ්‍යයන කටයුතු 2023 දෙසැම්බර් වන විට ආරම්භ වනු ඇත. මෙම ප්‍රයත්නයන් සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාළ ආයතන, සංවිධාන සහ අමාත්‍යාංශවලට තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

ප්‍රථම සහ එකම වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය කොළඹ පිහිටුවා ඇති බැවින් මහනුවර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, කෑගල්ල සහ අනුරාධපුර, පොළොන්නරුව සහ ඊසානදිග ප්‍රදේශවල සේවය කරන වෛද්‍ය නිලධාරීන්ට පවා එම වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන වැඩසටහන් හැදෑරීම අපහසු කාරණයක් විය.

මහනුවර ස්ථාපිතව ඇති මෙම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ශ්‍රී ලංකාවේ වෛද්‍ය නිලධාරීන්ට බලපාන මෙම ගැටලු නිරාකරණය කිරීමට හැකි වනු ඇත. මූලික උපාධියක් පමණක් ඇති උපාධිධාරියෙකු වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ගත් විට, ඔහුට/ඇයට තම සම වයසේ මිතුරන්ට සහ යටත් නිලධාරීන්ට වඩා හොඳ සේවාවක් සහ පුහුණුවක් ලබා දීමට හැකි වේ. මෙමගින් අප ප්‍රජාවේ, සමාජයෙහි සහ රටෙහි දැනුම් පදනම වැඩිදියුණු කෙරෙන අතර, විශේෂයෙන්ම සෞඛ්‍ය සහ යහපැවැත්ම සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ මග ඔස්සේ ශ්‍රී ලංකාව මෙහෙයවනු ඇත.

11 වන කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිපිසිජී/කේඩී/ඩී/පිජීඅයිඑම්එස්/2023/12 } ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 19 දින

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති ඔංථිටටට

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම් හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය කිරීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය	
i. 04 නියමය	විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි සිසුන් ඇතුළත් කර ගැනීම, වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රවල ඉගැන්වීම්, පුහුණු කිරීම් සහ පර්යේෂණ සඳහ පහසුකම් සැලැස්වීම යන මූලික අරමුණු කිසිවක් ඉටු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757	සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.
(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PE 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
i. 2.3 ඡේදය	ආයතනයේ සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය, සෑම වර්ෂයක් ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2022-2026 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම අදාළ ආයතන වෙත ඉදිරිපත් කර නොතිබුණි.
ii. 4.2 ඡේදය	විගණන හා කළමණාකරන කමිටුව මාස 03 කට වරක් බැගින් අවම වශයෙන් වසරකට රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය ප්‍රකාරව 2019 සැප්තැම්බර් 09 දින සිට ආයතනයේ කටයුතු බලාත්මක බවට පත්වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 3 ½ ක් පමණ ගත වී තිබුණද, කිසිදු අධ්‍යයන පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

2.2.2.

(අ)

අදාල කාර්යයන් ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොතිබූ බැවින් මෙය ප්‍රමාද විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය පාඨමාලා වලට ලැබී ඇත්තේ 2023 වර්ෂයේදීය. එබැවින් සිසුන් ඇතුලත් කර ගැනීමට නොහැකි විය. තවද මෙය පශ්චාත් උපාධි ආයතනයක් බැවින් සහතිකපත්‍ර, ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට 2022.05.21 දින පැවති 04 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී එකඟතාවය පල නොකිරීම හේතුවෙන් ඩිප්ලෝමා, සහතිකපත්‍ර පාඨමාලා ආරම්භ නොකරනු ලැබිය .

2023 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව එම වසරේම පාඨමාලා දෙකක් ආරම්භ කරන ලදී.

(ආ)

ආයතනය තුල ඉතාම සීමිත භාණ්ඩ ප්‍රමාණයක් තිබුණු බැවින් මෙය කඩිනමින් සිදු කිරීමට නොහැකි වූ අතර මෙය ඉදිරියේදී කරන බවට තහවුරු කරමි.

(ඇ)

i. 2.3 ඡේදය

ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.

ii. 4.2 ඡේදය

ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට අභ්‍යන්තර විගණන අංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

2.3 ඡේදය

(අ)

2019 සිට ආයතනය ආරම්භ කලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකතුමා පත්කරනු ලැබුවේ 2021 වර්ෂයේය. 2021 වර්ෂය වන විට මේ සඳහා නිත්‍ය කාර්ය මණ්ඩලයක් නොසිටි බැවින් අදාල සේවක සංඛ්‍යාව (cadre)අනුමත කර ගැනීම සිදු කිරීමට සහ කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලය පත් කර ගැනීමට යම් කාලයක් ගත වී ඇත. ඉන්පසු අදාල පාඨමාලා ආරම්භය සඳහා අවශ්‍ය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමට 2021 වර්ෂයේ සිට කටයුතු කල අතර එම පාඨමාලා පැවැත්වීමට අදාල අනුමැතිය ලැබුනේ 2023 වර්ෂයේදීය. තවද රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය, අරගලය සහ ඉන්ධන අර්බුදය සහ වෙනත් හේතූන් ද මේ සඳහා බලපාන ලදී.

2023 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව එම වසරේම පාඨමාලා දෙකක් ආරම්භ කරන ලදී.

(ආ)

නිසි ප්‍රතිපාදන නොමැති බැවින් මේ සඳහා ක්‍රියාකාරී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට නොහැකි උනි.